# ජාතික මාධ්‍ය හරහා යහපාලනය දිරිමත් කිරීම

2022 දී 'අරගලය' ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ බලයෙන් පහ කළ දා සිට රටේ පාලන ' ක්‍රමයේ වෙනසක් ' (system change ) අවශ්‍ය බව බොහෝ වේදිකාවල කතා බහට ලක් වූ මාතෘකාවක් විය. කෙසේ වෙතත්, පෙර නොවූ විරූ මේ සිදුවීමෙන් වසර දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, සමාජ, ආර්ථික සහ සංස්කෘතික සන්දර්භය රටට හිතකර වූ වෙනසක් සඳහා ශක්තිමත් රාමුවක් මෙතෙක් ප්‍රකාශයට පත් වී නොමැත. ජන ජීවිතය කැළඹීමකට ලක් කළ මේ සමාජ , සංස්කෘතික පෙරළියකින් පසු රට ව්‍යවසනකාරී ආර්ථික කඩාවැටීමකට ලක්ව ඇත. විශේෂයෙන් සාම්ප්‍රදායික ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂවල පාලනය ජනතාව ප්‍රතික්ෂේප කෙළේය. ඒ අනුව බලන විට 3% සිට 42% දක්වා ඡන්ද පදනම වැඩිකර ගැනීමට ජාතික ජන බලවේගය (NPP) සමත් වී ඇති බවයි. තුන්වැනි බලවේගය ලෙස දේශපාලනයේ නිරත වූ ජාතික ජන බලවේගය (NPP) , ජනාධිපතිවරණය ජයග්‍රහනය කිරීමෙන් පෙනී යන්නේ පැවති පාලන ක්‍රමයේ රැඩිකල්වාදී වෙනසක් ජනතාව අපේක්ෂා කළ බවයි.

පළමුව, ආර්ථික ප්‍රකෘතිය කඩිනම් කැර තිරසාර සංවර්ධනයක් කරා යොමු කළ යුතු වෙයි. පසුගිය ආණ්ඩුවල ඉහවහ ගිය අල්ලස, දූෂණය, රාජ්‍ය පහසුකම් හා මුදල් අවභාවිතය , දේශපාලනික අසාධාරණ තීරණ සහ පත්වීම් වැනි දේ තවදුරටත් මහ ජනතා ඉවසන්නේ නැත. දැනට වත්මන් ආණ්ඩුව බුක්ති විඳින ජනප්‍රියතාවය,ජනතාවගේ සහයෝගය සහ විශ්වාසය රඳවා ගැනීමට නම් යුක්තිය, නීතිය සහ සාමය ස්ථාපිත කැර පවත්වා ගෙන යා යුතුය.

ගාමණී කොරෙයා පදනම (GCF) යනු දිවංගත ආචාර්ය ගාමණී කොරෙයා , ආරම්භ කළ ආර්ථික , සමාජ, සංවර්ධන සඳහා වූ පර්යේෂණ ආයතනයකි. ශ්‍රී ලංකාව සහ අනිකුත් අඩු සහ මධ්‍යම ආදායම් ලාභී රටවල සමාජ, ආර්ථික සංවර්ධනය සඳහා නවෝත්පදන සහ උසස් තත්ත්වයේ ආර්ථික පර්යේෂණ හරහා දායක වීම ආචාර්ය ගාමණී කොරෙයාගේ සංකල්පයකි.

ගාමණී කොරෙයා පදනමේ (GCF) පර්යේෂණ හුදු ශාස්ත්‍රිය අභ්‍යාශයකට සීමා වී නැත. එය මූලික වශයෙන් සමාජ , ආර්ථික පරිවර්තනය සඳහා රුකුලක් වෙයි. ආචාර්ය කොරෙයාගේ අවශ්‍යතාවට අනුව, ගාමණී කොරෙයා පදනම (GCF) , ශ්‍රී ලංකාවේ නවෝත්පාදකයන්ගේ සංසදය (SLIF) ආරම්භ කරන ලදී. එහිදී විෂය පත්‍රිකා විස්සක්

පර්යේෂණය කිරීමට සහ හඳුනා ගත් දැවෙන ගටලු විසඳීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ද ප්‍රවීනයන්ට බාර දෙන ලදී.

යහපාලනය පිළිබඳ ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දුගේ පත්‍රිකාවෙහි සඳහාන් යහපාලනය පදනම් කැර ගත්, පාලන ක්‍රමයක් සඳහන් කැර ඇත. එය ඵලදායී ලෙස ක්‍රියාත්මක කළහොත් ආර්ථිකය ප්‍රකෘතිමත් වීමට සහ ජනතාව අපේක්ෂා කරන ආණ්ඩු වෙනසකට මඟ පැදිය හැකිය. නිසි පාලනයක් සහතික කිරීම සඳහා මාධ්‍යට ක්‍රියාකාරී කාර්ය භාරයක් වෙනදාට වඩා අද පැවරී ඇති බව අවිවාදිත යථාර්ථයකි. ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනී ශිරාණී දිසානායක, රංචනා කළ ‘ Catalyzing Good Governance Through National Media ’ නම් වූ කෘතිය මඟින් අද මාධ්‍යය තුළ ඇති ව්‍යාකූලත්වය ඇගේ අත්දැකීම්වලින් පෙන්නුම් කැර ඇත.

මාධ්‍යයේ අද පවතින තත්ත්වය ඇය විශ්ලේෂණය කරන අතර යහපාලනයේ මූලධර්ම ලෙස සැලෙකෙන සහභාගීත්වය, දැක්ම , සමානාත්මතාවය , විනිවිද භාවය, වගවීම, පුරෝකථනය කිරීමේ හැකියාව සහ ඵලදායිතාව සහතික කිරීම ජාතික මාධ්‍යයෙන් කළ හැකි සැලැස්ම මෙමඟින් සාකච්ඡා වෙයි.

මෙම කෘතියෙන් ශිරාණී දිසානායක, දශක හතරකට අධික කාලයක් රූපවාහිණී මාධ්‍ය ක්ෂේත්‍රය අත්දැකීම්, සිත්ගන්නා සුළු තීක්ෂණ බුද්ධියෙන් යුතු චින්තනාත්මක ගමනක් වෙත අප රැගෙන යයි. බොහෝ දෙනෙක් කල කිරීමෙන් පසුවන අතර ශිරණී, ඉන් ඔබ්බට ගොස් වඩා හොඳින් යමක් කළ හැක්කේ කෙසේ දැයි මෙනෙහි කිරීමට උත්සහ කරයි.

‘ Catalyzing Good Governance Through National Media ’ ග්‍රන්ථය එළිදැක්වීමට මේ වන විට කටයුතු සූදානම් කැර ඇති බව සඳහාන් කළ යුතුය. මෙම කෘතියේ පිටපත් ගාමණී කොරෙයා පදනමින් ලබාගත හැකිය.